" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

ISO 9001 | SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2023 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2023.05.18

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කම්ටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.05.15 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2023.05.08<br>රා.ප.චක්‍රලේඛ 07/2023 | 2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාරදුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සඳහා සහන ලබා දීම. |

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2023

මගේ අංකය : EST-3/POLIC/04/0064
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.05.08

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සඳහා සහන ලබා දීම

2023 පළාත් පාලන ඡන්ද විමසීම සඳහා නාම යෝජනා භාර දෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කිරීමට 2023.05.02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා අපේක්ෂකයන් ලෙස නාම යෝජනා භාර දී ඇති දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නිරත නිලධාරීන්ට, ඔවුන් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වී ඇති පළාත් පාලන බල ප්‍රදේශය තුළ පිහිටි රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නිරත වී සිටින්නේ නම්, නැවත සේවයට වාර්තා කිරීමට හැකි වන පරිදි අදාළ පළාත් පාලන බල ප්‍රදේශ සීමාවෙන් බාහිර බල ප්‍රදේශයක පිහිටි රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතන වෙත ස්ථාන මාරු කර සේවයට වාර්තා කිරීම සඳහා අවස්ථාව සලසා දීමට අදාළ බලධරයන් විසින් ක්‍රියා කළ යුතු ය.

03. ඒ අනුව, ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තියේ විධිවිධාන අනුව 2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සහ නාම යෝජනා භාර දෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි අර්ධ රාජ්‍ය නිලධරයන් 2023.05.09 දින සිට අදාළ ආයතන ප්‍රධානීන් විසින් නම් කරනු ලබන සේවා ස්ථානයක් වෙත සේවයට වාර්තා කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛය මැතිවරණ කොමිෂන් සභාවේ ද එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-696478
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-iii@pubad.gov.lk